පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - බුද්ධ ධර්මය

සතිය- 49

ශ්‍රේණිය - 10

Prepared by- ඒ.වී. චමින්ද විජේකුමාර ආරියදාස

# සියලුම පාඩම් ඇසුරෙන්

1. සිදුහත් කුමරුගේ ළමා අවදියේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ මොනවා ද?
2. මහ සඟරුවන තම සේවාවන් සපයන අංශ තුනක් දක්වන්න.
3. සංඝරත්නය මෙලොව ඇති වූයේ කිනම් පොහෝ දිනක ද?
4. භාවනාව දෙවදෑරුම් වේ. එම දෙයාකාරය නම් කරන්න.
5. විපස්සනා භාවනාව පිළිවඳව අර්ථ විග්‍රහකර ඇත්තේ කෙසේ ද?
6. මහා සෑයට පමණක් දෙවෙනි වන දුටුගැමුණු රජතුමා ඉදිකළ ගොඩනැගිල්ල කුමක් ද?
7. “උට්ඨානවතෝ සතිමතෝ” යන ධම්ම පද ගාථාවෙහි ඇතුළත් දෙලොව දියුණුවට හේතුවන කරුණු හත නම් කරන්න.
8. බුදු දහමෙහි සීලය අර්ථ දක්වා ඇත්තේ කෙසේ ද?
9. නැගෙනහිර, දකුණ, බටහිර, උතුර, යට සහ උඩ යන දිශාවන් වලින් දැක්වෙන සමාජ කොටස් නම් කරන්න.
10. පද්මාකාර ජීවිතය යනු කුමක් ද?
11. “සමග්ගා හෝත මා විවදථ” මෙහි තේරුම ලියන්න.
12. බුදුරදුන් කර්මය පිළිබඳව දේශනා කළ සූත්‍රයෙහි නම සහ එය දේශනා කළේ කවරෙකු හට දැයි දක්වන්න.
13. පංචස්කන්ධය නාම රූප වශයෙන් වෙන් කොට දක්වන්න.
14. පටිච්ච සමුප්පාද න්‍යාය ඉගැන්වෙන මූල සූත්‍රය ලියා දක්වන්න.
15. බුදු දහමේ මූලික ඉගැන්වීම් තුනක් දක්වන්න.
16. පරිසරය දූෂණය නොවන අයුරින් ක්‍රියා කිරීමට තම ශ්‍රාවකයන්ට බුදුරදුන් දුන් අවවාද මොනවාද?
17. බුද්ධ වචනය අනුව රෝග දෙයාකාරය. එය නම් කරන්න.
18. ආහාර පරිභෝජනය හා බැඳුණු සේඛියා 05ක් ලියා දක්වන්න.
19. අලුවිහාර සංගීතිය හෙවත් සිව්වන ථේරවාද සංගීතියේ දී ශ්‍රී ලාංකික ගෞරවනීය මහා සංඝරත්නය විසින් කරන ලද උතුම් යුග මෙහෙවර කුමක් ද?
20. ලක්දිව බුදු දහම ස්ථාපිත වීමත් සමග ගොඩනැගුණු මුල්ම ස්තූපය ලෙස සැලකෙන්නේ කුමක් ද?
21. අනුරාධපුර යුගයට අයත් පැරණිම සිංහල පද්‍ය හමුවන්නේ කුමන ස්ථානයකින් ද?
22. රාජ්‍ය පාලනයට උදව් කරගත හැකි බෞද්ධ ඉගැන්වීම4ක් නම් කරන්න.
23. ශ්‍රද්ධාවේ ආකාර දෙක නම් කරන්න.